ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
අංක 15/12, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය,
(තැ.පෙ. 563), කොළඹ 7.
தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களம்
இல. 15/12, மெயிற்லண்ட் கிறசன்ட்
(த. பெட்டி 563), கொழும்பு 7.
**Department of Census and Statistics**
15/12, Maitland Crescent,
(P.O. Box 563), Colombo 7.

Telephone
Director General } 695291
General Office } 682176, 682177
Telegrams } "Statistics"
Fax 94 - 1 - 695291

My No. } 3/AG/CA/2000
Your No. } ..............................
Date } 22-January-2001

..............................

..............................

## Census of Agriculture – 2002

I hereby inform that you have been appointed as a member of the working committee of the Census of Agriculture which is proposed to be conducted during the year 2002.

A preliminary discussion on this matter will be held at 10.00 am on 05th February 2001 in my office. Please note to attend this meeting.

A.G.W. Nanayakkara
Director General

| | | |
|---|---|---|
| 1. | Mr. A. G. W. Nanayakkara | Director General |
| 2. | Ms. D. B. P. S. Vidyaratne | Director |
| 3. | Dr. A. P. G. S. de Silva | Director |
| 4. | Mr. S. Madurapperuma | Additional Director |
| 5. | Mr. A. M. U. Dissanayake | Deputy Director |
| 6. | Mr. A. J. Satharasinghe | Statistician |
| 7. | Ms. D. D. M. V. Perera | Statistician |
| 8. | Mr. D. J. Dodangoda | Statistician |

කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ මූලික මෙහෙයුම් කමිටු සාකච්ඡාව

දිනය : 2001 - 02 - 05 දින පෙරවරු 10.00ට ප්‍රධාන කාර්යාලයේදී

සහභාගිත්වය

| | | |
|---|---|---|
| 1. ඒ පී ඩබ්ලිව් නනායක්කාර | මහතා | සංගණන අධිකාරි සහ ජන සං අ ජනරාල් |
| 2. බී ඩී පී එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 3. ආචාර්ය ගාමිණි ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 4. එස් මදුරප්පෙරුම | මහතා | අති. අධ්‍යක්ෂ |
| 5. ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 6. ඒ ජේ සනරසිංහ | මහතා | සංඛ්‍යාලේඛනඥ |
| 7. ඩී ඩී එම් වී පෙරේරා | මහත්මිය | සංඛ්‍යාලේඛනඥ |
| 8. ජේ දොඩම්ගොඩ | මහතා | සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරී හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

ජන සංගණනය පැවැත්වෙන 2001 වර්ෂයෙන් අනතුරුව එළඹෙන 2002 වර්ෂය තුළදී කෘෂිකාර්මික සංගණනයක් සිදුකළයුතු බැවින් ඒ සඳහා දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශය මගින් මේ දක්වා ගෙන ඇති පියවරවල් සහ එම ක්‍රියාවලිය තවදුරටත් ඉදිරියට ගෙනයාමේ අවශ්‍යතාවයත් මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය විය. මේ සඳහා 1973 සහ 1982 වර්ෂයේ සංගණන වලදී ලබාගත් අත් දැකීම් තුලින් කෘෂිකර්ම සංගණනයේ දී සිදු කෙරෙන කාර්ය භාරය නි. අධ්‍යක්ෂ දිසානායක මහතා විසින් විස්තර කරන ලදි.

සමස්ත සංගණන ක්‍රියාවලියේ එක් එක් පියවරයන් සහ ඒ සඳහා යෝජිත කාල පරාසයන් ඇතුලත් කාල රාමුවක්ද සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරන ලදි.

කෘෂිකර්ම සංගණනයේ කුඩා ගොවි කාණ්ඩයන්ගෙන් තොරතුරු ලබාගැනීමට සකස් කරන ලද යෝජිත ප්‍රශ්නාවලියේ කෙටුම් පතක්ද සාකච්ඡාවට භාජනය විය.
ලෝක ආහාර සංවිධානයේ උපදෙස් (FAO Guidelines) මත හඳුනා ගත් අදාල සියළු විස්තරාත්මක තොරතුරු ඇතුළත් කොට පහත සඳහන් උප ශීර්ෂයන් යටතේ ප්‍රශ්නාවලිය කෙටුම්පත් කොට තිබුණි.

1. හඳුනා ගැනීමේ තොරතුරු
2. ගොවිකාරකයා සහ ගෘහය (ගොවි කාරකයා සහ පවුලේ සාමාජිකයින්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු)

3. ඒ ඒ භෝගය යටතේ වූ බිම් ප්‍රමාණය (අයිතිය/කාරකත්වය)
4. කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ
5. වෙනත් තොරතුරු
6. ඉඩම් භුක්තිය හා භාවිතය
7. සත්ත්ව පාලනය

සංගණනය සම්බන්ධයෙන් පහත දැක්වෙන තීරණ වලට එළඹින.

1. ජන හා නිවාස සංගණනය පැවැත්වීමෙන් පසුව එම සංගණනයේ ඒකක ලැයිස්තු ගත කිරීමේ උපලේඛනයේ එෆ් 1 ආකෘතිය ඇසුරෙන් කෘෂිකර්ම සංගණනයේ ගොවි කාණ්ඩ /ගොවි කාරකයා හඳුනා ගැනීම
2. ලැයිස්තු ගත කිරීමේ උපලේඛනයේ එෆ් 1 ආකෘතිය දිවයින පුරා ඇති සංගණන කාණ්ඩ 100,000කින් ජායා පිටපත් කරගැනීම

3. සමස්ත කෘෂිකර්ම අංශය වතු හා කුඩා ගොවි කාණ්ඩ වශයෙන් බෙදා වෙන්කොට තොරතුරු රැස්කිරීම 1973 හා 1982 ක්‍රියාත්මක වූ ආකාරයටම

4. 2001 ජන සංගණනයේ සංගණන ඒකක ලැයිස්තුවට අනුව යමින් ගොවි කාරකයින් හඳුනා ගෙන එම අවස්ථාවේ දීම ගොවි කාණ්ඩ සඳහා තොරතුරු රැස්කිරීම සහ ප්‍රශ්නාවලියට ඇතුළත් කිරීම සඳහා, ආදායම/කාණ්ඩයේ බිම් ප්‍රමාණය/ගෘහස්ත පාරිභෝජනය සඳහා පමනක්ම නිෂ්පාදනයේ යෙදීම ගැන අවධානය යොමුකොට නිශ්චිත නිර්නායකයක් භාවිතා කරමින් සීමිත හා විස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට පියවර ගැනීම ([illegible]) .

5. වතු අංශය සඳහා 1982 පරිදි විස්තරාත්මක තොරතුරු රැස් කිරීම

6. කෙටුම්පත් කරන ලද ප්‍රශ්නාවලියේ යටතේ වූ සියලු කොටස් සහ උපදෙස් හා සංකල්ප අධ්‍යනය කිරීම ඉදිරි අවස්ථා වල්දි වඩාත් පුළුල්ව ~~වැඩිදුර~~ විමසීම.

7. ප්‍රශ්නාවලිය නියමිත ප්‍රමාණයකින් පිටු හතරකට සීමා කිරීම

8. සංගණනයේ දී යෝජිත විෂය පථය හා මූලික නිර්වචන, සංගණන ක්‍රියාවලිය පිළිබඳ සාරාංශමය විස්තරයක් සමග රැස් කරනු ලබන දත්ත ප්‍රකාශයකට පත් කරන ආකාරය (වගු) ද පැහැදිලි කර දත්ත භාවිතා කරන්නන් වෙත ඉදිරිපත් කොට ඔවුන්ගේ යෝජනා හා අදහස් ලබා ගැනීම
ඉන් අනතුරුව ප්‍රශ්නාවලිය තවදුරටත් දියුණු කොට ඔවුන් සමග සම්මන්ත්‍රනයක් පැවත්වීම

9. <u>මීලග සාකච්ජාව 2001-02-28 දින පෙරවරු 10.00 ට අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ කාර්යාලයේදි පැවැත්වීමටත් එදිනට කෘෂිකාර්මික ගොවි කාණ්ඩ ලැයිස්තු ගත කිරීමේ උප ලෙඛනයේ කෙටුම්පත සාකච්ජා කිරීමට නියමිතය.</u>

පෙරවරු 12.45 ට පමණ රැස්වීමේ කටයුතු නිමවිය.

ජේ.දොඩම්ගොඩ
සං ලේ (කමිටු ලේකම්)

## කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ මෙහෙයුම් කමිටු සාකච්ඡාව

දිනය : 2001- 02- 28 දින පෙරවරු 10.00ට ප්‍රධාන කාර්යාලයේදී

සහභාගිත්වය

1. ඒ. පී.ඩබ්ලිව්. නානායක්කාර මහතා සංගණන අධිකාරී සහ ජන සං.අ .ජනරාල්
2. බී. ඩී. ජී. එස්. විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණී ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. එස්. මුදුරප්පෙරුම මහතා අධ්‍යක්ෂ
5. ඒ. එම්. ශු. දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
6. ඩී. ඩී. එම්. වී. පෙරේරා මහත්මිය සංඛ්‍යාලේඛනඥ
7. ජේ. දොඩම්ගොඩ මහතා සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරී හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

යෝජිත කෘෂිකාර්මික සංගණනයේ මූලික කාර්යයක් වන ගොවි කාණ්ඩ ලැයිස්තු ගත කිරීමේ උපලේඛනයේ කෙටුම්පත මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය විය. ජන හා නිවාස සංගණනයේ එච් 1 ලේඛනය අනුව යමින් ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ වල සියලුම ගොවි කාරකයන් ලැයිස්තු ගත කිරීම සිදු කෙරේ. එම ස්ථාන වල සංගණන අර්ථ දැක්වීම අනුව ගොවි කාරකයකු හෝ කිහිප දෙනකු සිටී නම් ඔවුන්ගේ කාරකත්වයන් අනුව ලැයිස්තු ගත කෙරෙන අතර එකම පුද්ගලයෙකු කාරකත්ව කිහිපයක් යටතේ ක්‍රියා කරන අවස්ථා ඇත්නම් ඔවුන් ගේ නම් කාරකත්වයන්ට අනුරූප වාර ගණනක් ලැයිස්තු ගත කිරීමද කෙරෙනු ඇත.

02. කෘෂිකාර්මික ගෘහ ඒකක හඳුනා ගැනීමේ ක්‍රියාවලියේදී ධීවර ගෘහ කාණ්ඩද හඳුනා ගැනීමට හැකිදැයි විමර්ශනයට භාජනය කරන ලදී. එහිදී ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මාර්ගෝපදේශ වලට අනුව පෙනී ගියේ ගොවි කාණ්ඩ වල ඉටු කෙරෙන ධීවර කටයුතු පිළිබඳවය. කෙසේ වුවද මේ පිළිබඳ දීර්ඝ වශයෙන් සලකා බැලීමට පසුව තීරණය විය.

03. ලැයිස්තු ගත කිරීමේ උපලේඛනයේදී ගොවි කාණ්ඩ සඳහා වූ තොරතුරු කෘ.සං. 1 ලේඛණයට සීමා කළයුතු කාණ්ඩ හා කෘ.සං 11 එනම් විස්තරාත්මක ප්‍රශ්න මාලාව සම්පූර්ණ කළයුතු කාණ්ඩ සඳහා සීමාවන් කුමක්දැයි තීරණය කිරීම පිණිස පහත සඳහන් නිශ්චායක සලකා බැලේ.

1. වර්ෂය තුළ ලබාගත් ආදායම
2. ඉඩම හා සතුන් පිළිබඳ ප්‍රමාණයන්
3. වෙළඳපොල සඳහා නිෂ්පාදනය කරන සහ නො කරන

මේ අනුව වඩාත් සුදුසු යැයි තීරණය කෙරුණේ 3 වන නිර්නායකයයි. ඒ අනුව සීමාවන් සකස් කොට ලැයිස්තු ගත කිර්මේ උපලේඛනය පිළියෙල කිර්මටත් එය ඉදිරි සාකච්ඡාවේදී විමසා බැලීමටත් තීරණය විය.

4. මෙම උපලේඛනය පිළිබඳව අවසන් තීරණයකට එළඹ ගෙවත්ත ගොවි කාණ්ඩය යන නිර්වචන සලකා බැලීම.

11. මීලඟ සාකච්ඡාව 2001-03-12 දින පෙරවරු 10.00 ට අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ කාර්යාලයේදී පැවැත්වීමට තීරණය විය.

පෙරවරු 12.30 ට පමණ රැස්වීමේ කටයුතු නිමවිය.

ජේ. දොඩම්ගොඩ
සං. ලේ. (කමිටු ලේකම්) 3/2

**කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව**

දිනය : 2001 - 03 - 12 දින පෙරවරු 10.00ට ප්‍රධාන කාර්යාලයේදී

සහභාගිත්වය

| | | | |
|---|---|---|---|
| 1. | ඒ පී ඩබ්ලිව් තනායක්කාර | මහතා | සංගණන අධිකාරි සහ ජන සං අ ජනරාල් |
| 2. | බී ඩී පී එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 3. | එස් මුදුරප්පෙරුම | මහතා | ද.ශ්‍රී. අධ්‍යක්ෂ |
| 4. | ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 5. | ඒ ජේ සතරසිංහ | මහතා | සංඛ්‍යාලේඛනඥ |
| 6. | ඩී ඩී එම් වී පෙරේරා | මහත්මිය | සංඛ්‍යාලේඛනඥ |
| 7. | ජේ දොඩම්ගොඩ | මහතා | සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරී හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මෙදින සාකච්ඡා කරන ලද්දේ 2001-02-28 දින පැවති රැස්වීමේ සාකච්ඡා කරන ලද කරුණු ඇසුරෙන් සංශෝධනය කරන ලද කෘ.සං.1 උපලේඛනයයි. එම උපලේඛනයේ අංක 1 සිට 7 දක්වා තීරු පිළිබඳව කමිටුව එකඟත්වයකට පත්විය.

* කුඩා ගොවි කාණ්ඩවලින් දීර්ඝ වශයෙන් තොරතුරු රැස්කිරීමටත්, සංක්ෂිප්තව තොරතුරු රැස්කිරීමටත් යොදාගත යුතු නිර්ණායකය 8 වන තීරුවේ සඳහන් කර තිබුණි.
* යෝජිතව දක්වා තිබුනේ කාණ්ඩයේ නිෂ්පාදනය ප්‍රධාන කොටස අලෙවිය සඳහා හෝ සත්ත්ව පාලන කටයුත්තක් ඇති නම් සතුන්ගේ සේවය ලබා දී සැළකිය යුතු ආදායමක් ලබාගන්නේ නම් එම ගොවි කාණ්ඩ පිළිබඳ දීර්ඝ විස්තර රැස් කිරීමට කෘ.සං.2 ආකෘතියක් භාවිතා කිරීම
* එසේ නොවන ගොවි කාණ්ඩ වල සීමිත තොරතුරු කෘ.සං.1 ට සීමා කිරීම.

03.

* මෙම නිර්ණායකයට අතිරේකව ගොවි කාණ්ඩයේ බිම් ප්‍රාමාණය අවම සීමාවක් ඇති කිරීම සුදුසු දැයි විමසීය.
* එසේ නම් සත්ත්ව සංඛ්‍යාව පිළිබඳවත් අවම සංඛ්‍යාවක් තීරණය කිරීමට සිදුවන බවට අදහසක් පළ විය.
* කුමන නිර්වචනයක් යෙදුවද ගණන් ගන්නා නිලධාරීන්ට සරල නිර්වචනයක් නොවන්නේ නම් ප්‍රයෝගික නොවන බවද මෙහිදි අවධානයට ලක්විය.
* කාණ්ඩයේ බිම් ප්‍රමාණය නිශ්චය කිරීම පහසු කරුණක් නොවන අතර උදා. වශයෙන් පර්චස් 40 ට අඩුයැයි දැක් වුවහොත් සංඛ්‍යාත්මක වශයෙන් විශාල ගොවි කාණ්ඩ ගණනක තොරතුරු කෘ.සං.1 ට සීමා වීමෙන් තොරතුරු වලට ඇතිවන බල පෑම සැළකිල්ලට ගත යුතු බවද පලවිය.

* එම නිසා ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය තීරණය කිරීමේ දී ඉහත කරුණු සැළකිල්ලට ගෙන කිසියම් නිගමනයකට එළඹීමේ අවශ්‍යතාවයද සාකච්ජාවට භාජනය විය.
* මෙලෙස ගොවි කාණ්ඩය පිළිබඳ නිගමනයකට පැමුණුනහොත් කෘ සං 1 හි ඇතුළත් වන කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක බිම් ප්‍රමාණය ගණනය කිරීමට නොහැකි වන බැවින් කුඹුරු බිම් ප්‍රමාණය ඇතුළත් කිරීමට හැකිවන අයුරින් කෘ සං 1 ලේඛනය සංශෝධනය විය යුතු බවට අදහසක් පල විය
* කුඹුරු ඉඩම් විශාල සංඛ්‍යාවක් කෘ සං 1 හි ද ඇතුළත් වන්නේ නම් එම ඉඩම් පිළිබඳව විස්තරාත්මක තොරතුරු රැස් කිරීමට අවකාශයක් නොලැබෙන බවටද අදහසක් පලවිය.
* ඉදිරිපත් කොට තිබූ කෘ සං 1 ආකෘතියේ අවසාන තීරුවෙන් දක්වා තිබුණේ ගොවි කාණ්ඩය ගෙවත්තක්ද යන්න විමසීමටය. කෘ.සං.2 උපලේඛණය මගින් විස්තර රැස් නොකෙරෙන ගොවි කාණ්ඩ වලට ඇතුළත් වන ගෙවතු පිළිබඳ විස්තර වෙන් වෙන්ව ලබා ගැනීම සඳහා ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණයට අමතරව ගෙවත්තේ බිම් ප්‍රමාණයද විමසිය යුතු බැවින් ඒ සඳහා ද ඉඩකඩ සැලසිය යුතු බවද පල විය.
* ඉහත අදහස් සැළකිල්ලට ගෙන සකස් කරන ලද කෘ සං 1 ආකෘතියක පිටපතක් ද මේ සමග ඉදිරිපත් කරමි.

04. මීලඟ රැස්වීම 2001-04-02 සඳුදා පෙරවරු 10.00 ට අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ කාමරයේදී පැවැත්වීමට නියම විය.

මෙදින රැස්වීමේ කටයුතු මධ්‍යහ්න 12.00 ට පමණ නිමවිය.

ජේ. දොඩම්ගොඩ
සං ලේ (කමිටු ලේකම්)

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

**දිනය** - 2001-04-04 වන දින පස්වරු 2.00 ට ප්‍රධාන කාර්යාලයේදී

**සහභාගිත්වය**

1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරී සහ ජන සං අ. ජනරාල්

| | | |
|---|---|---|
| 2. බී ඩී පී එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 3. ආචාර්ය ගාමිණී ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 4. ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 5. ඒ ජේ සනරසිංහ | මහතා | සංඛ්‍යාලේඛනඥ |
| 6. ඩී ඩී එම් වී පෙරේරා | මහත්මිය | සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරී හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. 2001-03-12 දින පැවැති රැස්වීමේදී කෘ.සං.1 හා කෘ.සං.2 උපලේඛනයෙහි තොරතුරු රැස් කළ යුතු ගොවි කාරකයන් තෝරා ගැනීමේ ගැටළු සහගත තත්වය පිළිබඳව සාකච්ඡා කළ අතර, ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය සඳහා අවම සීමාවක් තිබිය යුතු බවටද අදහස් ඉදිරිපත් විය. ඒ අනුව කෘ.සං.1 උපලේඛනය තුන් ආකාරයකින් පිළියෙල කොට මෙදින සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරන ලදී.

**එනම්** -

(1) 8 වන තීරුවෙන් ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය පර්චස් 40 ට අඩුද, 9 වන තීරුවෙන් නිෂ්පාදනය ගෙදර පරිභෝජනය සඳහා යොදා ගන්නේද යනුවෙන් විමසීම.

(2) ඉහත කරුණු දෙකම එක් උපතීරුවකින් ලබා ගැනීම.

(3) බිම් ප්‍රමාණයකින් තොරව නිෂ්පාදනය ගෙදර පරිභෝජනය සඳහා යොදා ගන්නේද යන්න විමසීම.

ඉහත අංක.1 අනුව උපතීරු දෙකකින් යුත් උපලේඛනය මගින් තොරතුරු සියල්ල ලබා ගැනීම සඳහා පූර්ව පරීක්ෂණයක් කර, වඩාත්ම සුදුසු පරිදි කෘ.සං.1 උපලේඛනය සකස් කර ගැනීමටද කමිටු සාමාජිකයෝ එකඟත්වයට පත්වූහ.

03. තීරු අංක 11 සිට 36 දක්වා තීරු පිළිබඳවද ගැටලුවක් ඇති නොවූ අතර, කෘ.සං.2 උපලේඛනය සමගම පූර්ව පරීක්ෂණය කළ යුතු බවට තීරණය කළහ.

**කෘ.සං.2 උපලේඛනය**

04. ගොවි කාණ්ඩයේ නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අලෙවි කරනු ලබන ගොවි කාණ්ඩයන්ට අදාල විස්තර කෘ.සං.2 උපලේඛනයෙන් සම්පූර්ණ කරනු ඇත.

05. පවුල් කාණ්ඩයේ සියළුම සාමාජිකයන් අවශ්‍ය නොවන බවත්, වයස ස්ත්‍රී පුරුෂ භාවය හා අධ්‍යාපන සුදුසුකම් ආදිය පිළිබඳ විස්තර ගොවි කාරකයාගෙන් පමණක් ලබා ගැනීම ප්‍රමාණවත් බවට තීරණය විය.

06. 2 වන හා 3 වන කොටස් පිළිබඳ කමිටුව එකඟත්වයට පත්වූහ.

07. 4 වන කොටසෙහි සඳහන් පරිදි ගොවි කාණ්ඩයෙහි වැඩි බිම් ප්‍රමාණයක් එම ප්‍රා.ලේ.කොට්ඨාශයට පිටස්තරව පිහිටා ඇත්නම්, අදාල ප්‍රා.ලේ.කොට්ඨාශයේ නම සඳහන් කරනවාද,එසේ නොමැති නම් ප්‍රා.ලේ.කොට්ඨාශය අනුව ගොවි කාණ්ඩ වෙන් කර ගන්නවාද යන්න පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. මේ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගැනීම සඳහා මීලඟ කමිටු රැස්වීමේදී තවදුරටත් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමින් මෙම සාකච්ඡා වාරය පස්වරු 4.30 ට පමණ නිම කරන ලදී.

ඩී.ඩී.එම්.වී. පෙරේරා
සංඛ්‍යාලේඛනඥ

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනයඃ- 2001-09-26 වන දින පස්වරු 2.00 ට කෘෂිකර්ම අංශ කාර්යාලයේදී

සහභාගිත්වය

| | | |
|---|---|---|
| 1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා | සංගණන අධිකාරී සහ ජන සං ළ. ජනරාල් | |
| 2. බී ඩී පී එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 3. ආචාර්ය ගාමිණී ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 4. එස් මුදුරප්පෙරුම | මහතා | අධ්‍යක්ෂ |
| 5. ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 6. ඒ ජේ සතරසිංහ | මහතා | ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ |
| 7. ජේ දොඩම්ගොඩ | මහතා | ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ |
| 8. ඩී ඩී එම් වී පෙරේරා | මෙය | ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරී හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී පූර්ව පරීක්ෂාව සඳහා කෙටුම්පත් කරන ලද කෘ.සං.1 හා කෘ.සං.2 උපලේඛන සහ ගණන්ගන්නා නිලධාරීන් සඳහා උපදෙස් වැඩිදුර සාකච්ඡාව සඳහා ඉදිරිපත් කෙරිණ. තවද දත්ත භාවිතා කරන්නන් සඳහා සහ දිස්ත්‍රික් කාර්ය මණ්ඩල අදහස් විමසීම දින වකවානු ආදී කරුණු මෙන්ම ගණන්ගන්නා නිලධාරීන් ලෙස ගොවිසෙවන නියාමක ද නැතහොත් ග්‍රාම නිලධාරීන් යොදා ගන්නේද යන්නත් එසේ යොදා ගැණිමේ දි මවුන්ගේ අධීක්ෂන කටයුතු සිදු කිරීමට යොදාගන්නා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් පිළිබඳවත් දීර්ඝ වශයෙන් සාකච්ඡාවට යොමු විය.

එහිදී පහත තීරණයන්ට එළඹින.

- ගණන්ගන්නා නිලධාරීන් සහ මවුන්ගේ අධීක්ෂන කටයුතු සිදු කිරීමට යොදාගන්නා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් පිළිබඳව දිස්ත්‍රික් කාර්ය මණ්ඩලයෙන් ද අදහස් විමසීම.

- ජන සංගණනයේ පූර්ව ලැයිස්තු ගත කිරීමේ ලේඛනය අනුව යමින් එම ලේඛන යාවත් කාලීන කරන අතරෙහි දීම කෘ.සං.1 උපලේඛනයේ ගොවිකාරකයින් ලෙස හඳුනා ගත් පුද්ගලයින් සිටින ගෘහ මූලිකයින් ලැයිස්තු ගත කොට එම ගෘහ කාණ්ඩ වල සිටින ගොවිකාරකයින් සහ විස්තර ලබා ගැනීම. තවද කෘ.සං.1 හි කුඩා ගොවි කාණ්ඩ ලෙස සැලකෙන ගොවි කාණ්ඩ වල භෝග පිළිබඳ විස්තර ඇතුළත් කිරීමටත් විශාල ගොවි කාණ්ඩ ලෙස හඳුනාගත් එවා පිළිබඳ විස්තරාත්මක තොරතුරු කෘ.සං.2 ප්‍රශ්න මාලාවක් යොදා ගනිමින් විමසීම
- 10 වන කොටසින් ඉඩම් භාවිතය පිළිබඳව තොරතුරු ක්‍රමවත් නියැදුම් ක්‍රමය (Systamatic sampling Method) උපයෝගි කොට ගෙන සියයට දහයකගෙන් පමණක් විමසීම
- කාරකයා නිශ්චිත ලෙස මෙන්ම කිසිවකු මග නොහැරෙන අයුරින් හඳුනා ගැණිම සඳහා පහසු වන උපදෙස් සැකසීම

- කෘ.සං.1 උපලේඛනයේ 9 වන තීරුව 7 හා 8 තීරු දෙකෙහිම 1 කව නොකරන ලද ගොවි කාණ්ඩ මෙම තීරුවෙහි අනුක්‍රමිකව අංක කර ඒවා සඳහා කෘ සං 2 උපලේඛනයක් බැගින් සම්පූර්ණ කරන ලෙස සංශෝධනය කිරීම

- එම ලේඛනයේම 10 සිට 36 දක්වා තීරු වලට උඩින් යොදා ඇති විස්තරයේ වරහන් තුල වූ කොටස මුලින් යෙදීම.
- එම ලේඛනයේම 12 තීරුව ගොවි කාණ්ඩයට ගෙවත්තක් ඇතුළත්ද යන්න විමසා පිළිතුර ඔව් නම් රැළග කොටු දෙකෙහි ගෙවත්තේ බිම් ප්‍රමානය පර්චස් වලින් සටහන් කිරීමටත් නැත නම් කේතාංක 2 කව කිරීමටත් හැකිවන අයුරින් ප්‍රශ්නය යලි සකස් කිරීම
- උපලේඛනයේ හඳුනා ගැණීමේ තොතුරු මුල් පිටුවේ සටහන් කිරීමට හැකිවෙන අයුරින් සහ තීරු අතර සහ පේළි අතර වැඩි ඉඩකඩක් ලැබෙන අයුරින් ඒ 3 වර්ගයේ පෝරමයක මුද්‍රණය කිරීමට හැකිවන අයුරින් සැකසීම

- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීමට කලින් ප්‍රශ්න මාලාව ක්ෂේත්‍රයේ දී පූර්ව පරීක්ෂාවට භාජනය කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රශ්න මාලාව සහ සංගණනය පිළිබඳව සාමූහික අදහස් ලබා ගැනීම

<u>කෘසං.2 උපලේඛනය</u>

- කෘ.සං.1 උපලේඛනයේ යෙදූ අනුක්‍රමික අංකය කෘ.සං.2 උපලේඛනයේ ද යෙදීම සහ එම අංකය පළමු කාණ්ඩයේ සිට ග්‍රා නි කොටසේ අවසාන අංකය දක්වා අනුක්‍රමිකව අංකනය කිරීම

- අධ්‍යාපන තතත්වය පිළිබද උපදෙස් ගොවි කාරකයාගේ රැකියාව ආදිය සඳහා වූ කේත ජනසංගණන යේ දී භාවිතා කළ උපදෙස් පරිදි සකස් කිරීම
- 4 වන කොටස ස්ථිර භෝග ලෙස නම් කිරීම සහ 4.1 ප්‍රධාන වතු භෝග ලෙස නම් කිරීම
- 5 වන කොටසේ 5.1 ලෙස වී සහ 5.2 න් වෙනත් කාලීන භෝග ලෙස සැකැසීම

- 9 වන කොටසේ වූ මිරිදිය මසුන් පිළිබද වූ කොටස ඉවත් කිරීම

- 10 වන කොටසේ ගැහැණු යන යෙදුම වෙනුවට ගැහැණු සතුන් යන්නත් පිරිමි යන යෙදුම වෙනුවට පිරිමි සතුන් යන්නත් යෙදීම.

- වතු අංශයේ ප්‍රශ්න මාලාව සහ උපදෙස් සකස් කිරීමේ දී ඉහත දැක්වූ අදාල තීරණයන්ට අනුකූලව සකස් කිරීම

- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීම කැඳවීමට පෙර ප්‍රශ්නාවලිය පූර්ව පරීක්ෂාවට භාජනය කිරීම
- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීමට සමගාමීව ඔවුන්ගේ ලිඛිත අදහස් ලබා ගැනීම
- දෙමළ සහ ඉංග්‍රිසි පරිවර්තන කටයුතු සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකයන්ගේ සහාය ලබා ගැණීම

පස්වරු 5 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ජේ. දොඩම්ගොඩ
සංඛ්‍යාලේඛනඥ

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2001-10-12 වන දින පස්වරු 3.00 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණී ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. එස් මුදුරප්පෙරුම මහතා අධ්‍යක්ෂ
5. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
6. ඒ ජේ සතරසිංහ මහතා ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ
7. ජේ දොඩම්ගොඩ මහතා ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ
8. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මේදින පැවැති රැස්වීමේදී පූර්ව පරීක්ෂාව සඳහා කෙටුම්පත් කරන ලද කෘ.සං.1 හා කෘ.සං.2 උපලේඛන කමිටුව යෝජනා කළ සංශෝධන ඇතුළත් කොට වැඩිදුර සාකච්ඡාව සඳහා ඉදිරිපත් කෙරිණ. දත්ත භාවිතා කරන්නන් දැනුවත් කිරීම සඳහා එක් දින වැඩ මුළුවක් සංවිධානය කිරීමට අදාල කටයුතු සහ නියමු සංගණනය පිළිබඳව ද සාකච්ඡා කරන ලදි .

එහිදී පහත තීරණයන්ට එළඹින.

- සංශෝධිත කෘ.සං.1 උපලේඛනයේ කළයුතු වෙනස්කම් නියමු සංගණනයෙන් පසුව එම අත්දැකීම් ද පදනම් කොට ගෙන වැඩිදුර සලකා බැලීම

<u>කෘසං.2 උපලේඛනය</u>

- කෘ.සං.2 උපලේඛනයේ මුල් පිටුවේ අන්තර්ගතය ඒ අයුරින්ම යොදාගැණීමටත් අනෙක් පිටුවල පහත දැක්වෙන සාංශෝධන ඇතුළත් කිරීම
- කෘ.සං.2 උපලේඛනයේ දෙවන පිටුවේ පොල් වගාවේ ක්‍රමවත් වගාවට අයත් ඵල නොදරණ යටතේ යොදා ඇති පාඨයට ඵල නොදරණ (නොපිදුන වගාව) ලෙස සහ 'ගස්යට වගාව කල' යන්නට 'යටි වගාව' ලෙසත් සහ 'ගස්යට වගාව නොකල' යන්න 'අපොත් වගාව' ආදී වශයෙන් සඳහන් කිරීම
- 4 වන කොටස වෙනත් ස්ථිර භෝග සඳහා ප්‍රාදේශීය මට්ටමින් වැදගත් යයි සැළකෙන භෝග කිහිපයක් හෝ ඇතුළත් කිරීමට හැකි වනසේ විවෘත තීරු කිහිපයක් සඳහා ඉඩ හැරීම සහ දැනටමත් නම් සඳහන් කොට දක්වා ඇති භෝග දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීමේ දීද ඔවුන්ගේ අදහස් අනුව යලි පෙළ ගැස්වීම
- කාලීන භෝග යටතේ ධාන්‍ය වර්ග සහ ප්‍රධාන එළවළු කිහිපයක් ඇතුළත් කිරීම සඳහා අවකාශ සැපයීම

ඒ ඒ ප්‍රා . ලේ. කොට්ඨාශයන්හි නියමු සංගණනය කළයුතු ගම සහ ග්‍රාම නිලධාරි කොටස තෝරා සඳහන් කොට දිස්ත්‍රික් කාර්යාල වලට ලබා දීම සහ සෑම ප්‍රා . ලේ. කොට්ඨාශයකින්ම කෘසං.2 උපලේඛන 20 ක් වත් සම්පූර්ණ කරවා ගැනීම

- අවශ්‍ය ප්‍රශ්න මාලා උපදෙස් සහ ආකෘති පත්‍ර වල පිටපත් සකස් කිරීම
- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීමට කැඳවීමට අදහස් කර ඇති රජයේ සහ රජයේ නොවන ආයතන වල ලැයිස්තුව සැකසීම ඒ සඳහා ස්ථානයක් ලෙස නරේසා ආයතනය (NARESA) යොදා ගැනීම දිවා ආහාරය ඇතුළත්ව තේ සැපයීම නොවැම්බර් මස 6 වන අඟහරුවාදා දින වෙන්කිරීම

පස්වරු 4. 30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය .

ජේ. දොඩම්ගොඩ
සංඛ්‍යාලේඛනඥ

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2001-12-14 වන දින පස්වරු 3.00 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරී සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්‍ෂ
3. ආචාර්ය ගාමිණී ද සිල්වා මහතා අධ්‍යක්‍ෂ
4. එස් මුදුරප්පෙරුම මහතා අධ්‍යක්‍ෂ
5. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්‍ෂ
6. ඒ ජේ සතරසිංහ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
7. ජේ දොඩම්ගොඩ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
8. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජේ. සංඛ්‍යාලේඛනඥ
9. සී ඩී ද සිල්වා මිය ජේ. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරී හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මේදින පැවැති රැස්වීමේදී දත්ත භාවිතා කරන්නන් ලිඛිතව ඉදිරිපත් කොට තිබුන අදහස් පිළිබඳව සලකා බලා යට දැක්වෙන සංශෝධනයන් සහ එකතු කිරීම් සිදු කරන ලදි .

- 2.4 හි අධ්‍යාපන සුදුසුකම් යටතේ කේතාංක 6 ඉදිරියෙන් 'උසස් අධ්‍යාපන සුදුසුකම් යන්න වෙනුවට 'උපාධිය සමත්' යනුවෙන් යෙදීම

- කෘෂි ලිං යටතේ වගා කොට ඇති බිම් පිළිබඳව ප්‍රශ්නයක් සකස් කොට ඇතුළත් කිරීම [illegible]

- 5.2.7 හි *මල්/විසිතුරු පැළ බිම් ප්‍රමාණය'* වෙනුවට *'මල්/විසිතුරු පැළ වෙළදාම සඳහා මෙම ගොවි කාණ්ඩයේ වගා කරනු ලැබේ ද'* යන ප්‍රශ්නය ඇතුළත් කිරීම

- වී වගාවේ අත්හැර දමා ඇති බිම් ප්‍රමානය විමසීම සඳහා යෝජනා වී ඇති අදහස ප්‍රතික්ෂේප විය. දැනටමත් පී 1 ලේඛන යටතේ සීමිත තොරතුරක් එක් රැස්කෙරේ.

- සත්ත්ව පාලනය පිළිබඳව විමසන ලද 8 වන කොටසේ 8.1 (C) හි 'අවු 1ට වැඩි පැටවකු නොලද' යන්න 'අවු 2 ට අඩු පැටවකු නොලද' යනුවෙන් සංශෝධනය කිරීම සහ මෙම කොටස සඳහා යෝජනා කොට ඇති අනෙකුත් වෙනස්කම් පශු සම්පත් හා සත්ත්ව සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් හා වැඩිදුර සාකච්ඡා කොට තීරණයකට එළඹීම
- 5.2 හි වූ 'වෙනත් කාලීන භෝග' යටතේ 5.2.7 'මාංශ භෝග' 5.2.8 'රට භෝග' 5.2.9 'තෙල් භෝග' 5.2.10 *අල භෝග* යන භෝග වර්ගයන් ඇතුළත් කිරීම

- 6 වන කොටසේ ඇතුලත් යන්ත්‍රෝප කරන ලැයිස්තුවේ 6.3 හි සඳහන් 'දියර හෝ කුඩු ඉසින යන්ත්‍ර' වෙනුවට 6.3.1 'අතින් ක්‍රියා කරන දියර ඉසින' හා 6.3.2 'බල ඉසින යන්ත්‍ර' ලෙසත් 6.4 හි සඳහන් 'ධාන්‍ය වෙන් කරන යන්ත්‍ර' යන්න වෙනුවට 6.4.1 හි *'අතින් ක්‍රියා කරන කොළ මඩින යන්ත්‍ර'* යන්නනත් 6.4.2 හි *'බල කොළ මඩින යන්ත්‍ර'* යන්නනත් ලෙස ඇතුළත් කිරීම

- වතු අංශයේ සංගණන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන වතු ලැයිස්තුවක් පිළියෙල කිරීම සඳහා පසුගිය ජන සංගණනය සඳහා පිළියෙල කොට ඇති ලැයිස්තුව අනුව යමින් එම තොරතුරුද ඇතුළත් පූර්ණ වතු ලැයිස්තුවක් සකස් කිරීම සඳහා වූ කෙටුම්පතක්ද කෘෂිකර්ම සංගණන වතු උපලේඛනය සඳහා වූ කෙටුම්පතක් ද කමිටුව වෙත ඉදිරිපත් කෙරින. වතු ලැයිස්තුවේ 4 වන තීරුවේ මුලින්ම සඳහන් වන

'උපකොටස්' යන්නට ඉදිරියෙන් වත්ත හෝ උපකොටස්' යනුවෙන් සංශෝධනය විය යුතු බැව් පෙන්වා දෙනු ලැබීය.

- වතු ලැයිස්තුව සම්පූර්ණ කරවා ගැනීමේ කටයුතු සඳහා කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන නිලධාරීන්ට කිසියම් දීමනාවක් ගෙවීමටත් එම කටයුතු 2002 ජනවාරි - පෙබරවාරි මාස තුළ දී ඉටු කරගැනීමටත් අදහස් කරන බව ප්‍රකාශ විය.

- ගොවි කාණ්ඩ කිසිවකුත් මග නොහැරෙන පරිදි හඳුනා ගැනීම වඩාත් වැදගත් බව අවධාරනය කෙරෙන පරිදි සකසන ලද දෙබසක් ගණන් ගණනා නිලධාරියාගේ අත්පොතට අඩංගු කිරීමටත් එහිදී එම දෙබසේ අඩංගු ඇතම් වචන වෙනස් කොට එහි අන්තර්ගතයම ඇතුළත් කිරීමට තීරණය විය.

- නියමු සංගණනයේ ලැබී ඇති දිස්ත්‍රික් වාර්තා ඇසුරෙන් ද සංශෝධනයන් කිහිපයක් සිදු කිරීමට තීරනය විය. මෙහි දී නියමු සංගණනයේ වැදගත් කමත් එහි නිරත වන්නන් ඇතුළු ක්ෂේත්‍ර කාර්‍ය මණ්ඩලවල අදහස් සහ යෝජනා ලබා ගැනීමේ වැදගත් කමත් සැළකිල්ලට ගත යුතු බැව් අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ප්‍රකාශ කරන ලදි.

- කෘ සං 1 උපලේඛනයේ 9 වන තීරුව වඩාත් සරල යෙදුමකින් විස්තර වනසේ ' 7 හා 8 තීරු දෙකෙහිම 1 කව නොකළේ නම්' යන්න වෙනුවට ' 7 හා 8 තීරු දෙකෙන් එකකට හෝ 2 කව කළේ නම්' යන්න ඇතුළත් කිරීම

- කෘ සං 1 උපලේඛනයේ 5 හා 6 වන තීරු දෙක අතරින් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය පිළිබඳව විස්තර ඇතුළත් කිරීම සඳහා අවකාශයක් සැපයීමට නොහැකි බව පෙන්වා දෙන ලදි.

- කෘ සං 2 ප්‍රශ්න මාලාවේ 1 වන කොටසේ 1.4 ග්‍රා.නි.කො. අංකය සඳහා යොදා ඇති කොටු දෙක වෙනුවට කොටු තුනක් යෙදීම

- ගණන් ගණනා නිලධාරියාගේ අත්පොතෙහි සඳහන් ගෙවත්ත යන්නෙහි අර්ථ දැක්වීම වඩාත් පැහැදිලි අයුරින් නැවත ඉදිරිපත් කිරීමටත් උදාහරන මඟින් පැහැදිලි කිරීමේ අවශ්‍යතාවයත් පෙන්වා දෙන ලදි.

- දත්ත සැකසුම් අංශය ද කෘෂිකර්ම සංගණනය පිළිබඳව දැණුවත් කොට සහභාගි කරවා ගෙන නියමු සංගණන ප්‍රශ්නමාලා ඇසුරෙන් පරිගනක වැඩ සටහන් සැකසීමේ අවශ්‍යතාවයද මෙහිදී සාකච්ඡා විය. දත්ත සැකසීමේ කාර්‍යය කඩිනමින් හා පහසුවෙන් ඉටු කළහැකි වෙනත් විකල්ප ක්‍රියා මාර්ග පිළිබඳවද දීර්ග ලෙස සාකච්ඡා කරන ලද නමුත් නිශ්චිත තීරනයක් ගැනිමට පහසු වනු වස් නියමු සංගණන තොරුතුරු 'ස්කැනර්' යන්ත්‍ර (scanner) ප්‍රයෝජනයට ගෙන ඉටුකර ගතහැකිදැයි සාකච්ඡා විය.

- ජන සංගණනයේ දී සංගණන කාණ්ඩ මට්ටමින් පිළියෙළ කොට ඇති පූර්ව ලැයිස්තු ගත කිරීමේ ලේඛනයන් ඡායා පිටපත් ගැනීම පිළිබඳවද සාකච්ඡා විය. ඒ සඳහා අවම වශයෙන් ඡයා පිටපත් ලක්ෂ 8 ක් වත් වැය වෙතැයි ද මෙම කටයුත්ත කරගත හැකි විකල්ප මාර්ග ගැනද සලකා බලන ලෙස අධ්‍යක්ෂ ජනරාල් වරයා දන්වන ලදි. තවද මෙම කටයුත්තද 2002 පෙබරවාරි මාසයේ දී වත් ආරම්භ කළයුතු බැව් දන්වන ලදි.

පස්වරු 4. 30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ජේ. දොඩම්ගොඩ 12/20
සංඛ්‍යාලේඛනඥ

# කාර්මික සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2002-01-11 වන දින [illegible]

සහභාගිත්වය

1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරී සහ ජන. ලේ. අ. ජනරාල්
2. ඩී බී පී එස් විද්‍යාරත්න මෙහෙත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණි ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. එස් මුදුනප්පෙරුම මහතා අධ්‍යක්ෂ
5. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
6. සී එන් ගලහිටියාව මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
7. ජේ දොඩම්ගොඩ මහතා ජ්. සංඛ්‍යාලේඛනඥ
8. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජ්. සංඛ්‍යාලේඛනඥ
9. සී ඩී ද සිල්වා මිය ජ්. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී සංගණනයේ කා සං 2 ප්‍රශ්න මාලාව 'ස්කැනර්' කොට පරිගනක ගත කිරමේ හැකියාව පිළිබඳව එම සේවා සපයන ආයතනයේ නියෝජිත මහතුන්ගේ අදහස් විමසන ලදි . එම නියෝජිත මහතා දැක් වූ අදහස් පරිදි දැනට කෙටුම්පත් කොට ඇති කා සං 2 ප්‍ර ශ්න මාලාව සුළු වශයෙන් සංශෝධනය කොට ඒ සඳහා භාවිතයට ගත හැකි බව දන්වන ලදි . කෙසේ වුවද මෙම ප්‍රශ්න මාලාව කළු සහ තවත් විශේෂ පාට අකුරුවලින්, කඩදාසියක මුද්‍රනය (quated paper with two colours, black and some dropout colour with uniformity in squares) කිරීමට සිදුවන බව පෙන්වා දෙන ලදි කෙසේ වුවද දැනට තිබෙන ස්කැනර් එක භාවිතයෙන් මිලියනයක් පමන වූ ප්‍රශ්න මාලාවල දත්ත 'ස්කැනර්' කිරීම සඳහා දිනකට 5000 බැගින් වැඩ කරන දින 200 ක් වත් වැය වන බව දන්වන ලදි. තවද දැනට මිලියන 1.2ක් වූ රාජ්‍ය සේවා නියුක්තිකයන්ගේ සංගණනයේ කටයුතුද ඉටු කෙරෙන බැවින් එය තවත් ප්‍රමාද විය හැකි බවද පවසන ලදි . අධ්‍යක්ෂ ජනරාල් වරයා මේ සඳහා විකල්පයක් ලෙස සියයට 10 නියැදියකින් මූලික වාර්තාව සැකසීම සඳහා දත්ත විශ්ලේෂනය කළ හැකි බවත් ගතවන පෙන්වා දෙන ලදි. සියයට දහයක නියැදියක් විශ්ලේෂනය කොට ශුද්ධ කරන ලද දත්ත පදනමක් සකසා ගැනීම මාස 4කින් ඉටු කළ හැකි බවද පවසන ලදි මේ පිළිබඳව වැඩිදුර විමසා බැලීමට තීරණය විය.

අනතුරු එම නියෝජිත මහතුන් සමගම ජනසංගණන පූර්ව ලැයිස්තු ගත කිරීමේ ආකෘතිය (F1) 'ස්කැනර්' කොට සුරැකිව තැබීම CD තැටි 30 ක දළ වශයෙන් රුපියල් 3000 ක් සහ පිටපත් ලබා ගැණිම පිළිබඳව විමසන ලදි. එහි දී එම කටයුත්ත ජයා පිටපත් ලබා ගැනීමට වඩා ඇති ප්‍රයෝජන මුල්‍යමය වාසි පිළිබඳව සාකච්ඡා කරන ලදි. අවම වශයෙන් සංගණන කාණ්ඩ 100,000 ක F1 පිටපත් ලක්ෂ 5 ත් 6ත් අතර ලබා ගැනීම අවශ්‍ය බව දන්වන ලදි මෙම කටයුත්ත ජූලි මස මුල්දී අවසන් කිරීමට ඇති ඉඩකඩ දැනට තිබෙන ස්කැනර් එක පමනක් භාවිතයට ගෙන ඉටු කළ නොහැකි බැවින් ඒ සඳහා වඩා වේගවත් ස්කැනර් යන්ත්‍රයක් සේවය සඳහා යොදාගත යුතු බවත් වඩා වේගවත් මුද්‍රණ යන්ත්‍රයක සේවාව ද ලබා දිය හැකි බව නියෝජිත මහතුන් පෙන්වා දෙන ලදි. ඒ 3 ප්‍රමානයේ පිටපත් 500,000 ක් ස්කැනර් කිරීමට සහ මුද්‍රනයට වැය වන මුදළ පිළිබඳව ඇස්තමේන්තුවක් දින 4 කින් ඉදිරිපත් කිරීමට නියොජිත මහතා පොරොන්දු විය.

අනතුරුව සාකච්ජාවට ගැනුනේ මුද්‍රණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් මෙම සේවා ලබා ගැණිමේ හැකියාව පිළිබඳවය. මේ සඳහා ලේසර් පින්ටර් 10 ක් දිනකට පැය10 බැගින් සේවයේ යොදවා නියමිත දිනට මෙම කටයුත්ත කරදිය හැකි බව පවසන ලදි කෙසේ වුවද ඉදිරියේදී බලාපොරොත්තු විය හැකි විදුලි අවහිරතා පිළිබඳව විමසීමේ දී එම කටයුත්ත ට වඩා බැරෑරුම් විය හැකි බව කමිටුව පෙන්වා දෙන ලදි. තවද F1 පිටපත් අස්ථාන ගත වී හෝ ඉරී කොටස් විනාශ වී ගොස් ඇති සහ දෙපාර්තමේන්තුව වෙත නොලැබී ඇති ස්ථාන ද ඇති බව දන්වන ලදි .

ඉන් ඉක්බිතිව සංගණනය සඳහා අවශ්‍ය වන ආකෘති මුද්‍රණය, කඩදාසි පිළිබඳව සාකච්ඡා විය . පහත දැක්වෙන ආකෘති ප්‍රමාණයන් මැයි මස අවසන් වන විට මුද්‍රණය කරදිය හැකි බව මුද්‍රණ අංශය භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ දැණුම් දෙන ලදි.

| | |
|---|---|
| දැන්වීම් පත්‍රිකා (Posters) | 150,000 |
| ගොවි කාණ්ඩ ලැයිස්තු ගත කිරීමේ ආකෘතිය AC1) | 20,000 (15 pages) |
| කුඩා ගොවි කාණ්ඩ ප්‍රශ්නාවලිය AC2) | 2,000,000 ( 4 pages) |
| පත්වීම් ලිපි අක්ත පත්‍ර | 20,000 |
| දිවුරුම් ප්‍රකාශන | 20,000 |
| කෘ සං 2 සාරාංශ වාර්තා (AC2 Summaries) | 150,000 |
| වතු උපලේඛනය (Estate Schedule) | 20,000 (12 pages) |
| උපදෙස් පොත (Instruction manual) | 20,000 (42 Pages) |

මේ සඳහා කඩදාසි රීම් 1000 ක් සහ ජයා පිටපත් A 3 ප්‍රමාණය 500,000 මිලයට ගැණිම සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 4ක් වැය වන බව පැවසීය. මුද්‍රණය සඳහා වූ අවසන් කෙටුම්පත් ලබන සතියේ මුද්‍රණ අංශය වෙත ලබා දිය හැකි බව 3 වන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ දැණුම් දෙන ලදි .

සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු සැප්තැම්බර් ඔක්තෝම්බර් මාස වල ඉටු කිරිම වඩා යෝග්‍ය බව අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහසට කමිටුව එකඟ විය.
අනතුරුව එළඹියේ කෘ සං 1 කෘ සං 2 සහ උපදෙස් පොතේ සංශෝධිත කොටස් පිළිබඳව වැඩිදුර විමසා බැලීමය.
කෘ සං 1 උපලේඛනයේ 7 සහ 8 තීරු දෙක වෙනුවට එක් නිර්නායකයක් ලෙස 7 වන තීරුවේ ගොවි කාණ්ඩය සමන්විතවී ඇත්තේ ගෙවත්ත පමනක් ද යන්න විමසා එසේම සියලු ගෙවතු පිළිබඳ විස්තර කෘ සං 1 තුළින් සෙසු ඒවායේ විස්තර කෘ සං 2 තුළින් විමසිය හැකි බව යෝජනා විය මෙහි දී නිෂ්පාදන අලෙවිය පිළිබඳ විමසීමක් නොකෙරෙන බැවින් ලිඛිතව ඉදිරිපත් කොට තිබුන අදහස් නුවරඑළිය වැනි දිස්ත්‍රිකක වල පර්චස් 20 ට අඩු එහෙත් නිශ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අලෙවි කෙරෙන ගොවි කාණ්ඩ පිළිබඳව විස්තර මගහැරෙන බැවින් එය ලබා ගැනීමේ වැදගත් කම පිළිබඳව සලකා බලා තීරනය කළ යුතු බව දන්වන ලදි. පහත සංශෝධන කිරීමට එකඟත්වය පළ විය.

- කෘ සං 2 හි අධ්‍යාපන 2.4 අධ්‍යාපන සුදුසුකම් යටතේ කේතාංක 6 ඉදිරියෙන් 'උසස් අධ්‍යාපන සුදුසුකම් යන්න වෙනුවට 'උපාධිය හෝ රට ඉහළ විභාගයක් සමත්' යනුවෙන් යෙදීම
- කෘ සං 2 හි අධ්‍යාපන 3.2 යටතේ (F) හි ගොවිකාරකයා කාරකත්වය දරණ වෙනත් ඉඩම් (ඉහත කාණ්ඩ වලට අයත් නොවන) යනුවෙන් ඇතුලත් කිරිම
- 5.3 කෘෂි ලිං යටතේ වගා කොට ඇති බිම් පිළිබඳව ප්‍රශ්නයක් සකස් කොට ඇතුළත් කිරිම
- 5.2.11 හි *මල්/විසිතුරු පැල බිම් ප්‍රමාණය'* වෙනුවට *මල්/විසිතුරු පැළ විකිණිමට වගා කෙරේද ?* යන ප්‍රශ්නය ඇතුළත් කිරීම
- සත්ත්ව පාලනය පිළිබඳව පශු සම්පත් හා සත්ත්ව සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් හා වැඩිදුර සාකච්ජා කොට ඇතුලත් කළ සංශෝධනයන්ට එකඟවීම
- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ලෝන හා වයස පිළිබඳ සංශෝධිත යෝජනා වලට එකඟවීම
- 5.2 හි වූ 'වෙනත් කාලීන භෝග' යටතේ 5.2.6 'වෙනත් ධාන්‍ය වර්ග ' 5.2.7 'මාංශ භෝග' 5.2.8 'තෙල් භෝග' 5.2.9 'වෙනත් අල වර්ග ' 5.2.10 'එළවළු' ඇතුළත් කිරීම
- 6 වන කොටසේ ඇතුලත් යන්ත්‍රෝප කරන ලැයිස්තුවේ 6.3 හි සඳහන් 'දියර හෝ කුඩු ඉසින යන්ත්‍ර' වෙනුවට 6.3.1 'අතින් ක්‍රියා කරන දියර ඉසින' හා 6.3.2 'බල ඉසින යන්ත්‍ර' ලෙසත් 6.4 හි සඳහන් 'ධාන්‍ය වෙන් කරන යන්ත්‍ර' යන්න වෙනුවට 6.4.1 හි '*අතින් ක්‍රියා කරන කොළ මඩින යන්ත්‍ර*' යන්නනත් 6.4.2 හි '*බල කොළ මඩින යන්ත්‍ර*' යන්නනත් ලෙස ඇතුළත් කිරිම

සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු සහ ප්‍රවාහන කටයුතු පිළිබඳව අතිරේක අධ්‍යක්ෂගේ සහයෝගය ඉල්ලා සිටීම සහ සංගණන කටයුතු වල දිස්ත්‍රික්ක සහ පළාත් සංවිධානය ගැනද තාක්ෂනික කටයුතු සංවිධානය දැක්වෙන සටහන ද සාකච්ජා වීය

දහවල් 12.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ජේ. දොඩම්ගොඩ
ජේ. සංඛ්‍යාලේඛනඥ

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2002-02-14 වන දින පස්වරු 2.30 ට ප්‍රධාන කාරයාලයේ දී

සහභාගිත්වය

| | | | |
|---|---|---|---|
| 1. | ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා | | සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල් |
| 2. | බී ඩී පී එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 3. | ආචාර්ය ගාමිණි ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 4. | එස් මදුරප්පෙරුම | මහතා | අධ්‍යක්ෂ |
| 5. | එස් සංගරපිල්ලේ | මහතා | ආරාධිත |
| 5. | ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 6. | ඩී එම් ආර් ප්‍රනාන්දු | මහතා | පද්ධති විශ්ලේෂක වැඩසටහන් සම්පාදක |
| 7. | ජේ දොඩම්ගොඩ | මහතා | ජ්‍යෙ. සංඛ්‍යාලේඛනඥ |
| 8. | ඩී ඩී එම් වී පෙරේරා | මෙය | ජ්‍යෙ. සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන' සාකච්ඡාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී කෘ.සං.2 උපලේඛනයේ දත්ත සැකසුම් කටයුතු පිළිබඳව පද්ධති විශ්ලේෂක මිගාර ප්‍රනාන්දු මහතාගේ නිරීක්ෂණ ඉදිරිපත් කෙරින. ඒ අනුව එම උපලේඛනයේ 3 වන කොටසේ 3.2 , 5 , 6 සහ 7 කොටස් වල අංකනය නිවැරිදි කිරීමට තීරණය විය.

කෘ.සං.2 උපලේඛනයේ දත්ත සැකසුම් කටයුතු ස්කැනර් කිරීම පිළිබඳව පුළුල්ව සලකා බැලීමෙන් ස්කැනර් කිරීම සහ දත්ත පරිගනක වැඩ සටහනක් මගින් එම කටයුත්ත ඉටු කරගැනිම යන ක්‍රම දෙකටම යොදාගත හැකිවන අයුරින් ප්‍රශ්න මාලා සකස් කිරීම සහ මුද්‍රණය කිරීම යෝග්‍ය බව අදහස විය.

මෙම ප්‍රශ්න මාලාවේ විචල්‍යයන් විශාල සංඛ්‍යාවක් හා සීමිත ඉඩක් (More Fields & Limited Space) තිබීම ස්කැනර් කිරීමෙන් දත්ත ග්‍රහනය කිරීම සහ කියවීම ප්‍රමාදවිය හැකි සහ කුඩා කොටු තුල දත්ත ඇතුළත් කිරීමේ දී ඇති විය හැකි දෝශයන් ද අවම කරගත යුතුව ඇති බැවින් ඉහත අයුරින් ක්‍රම දෙකටම ගැලපෙන අයුරින් ප්‍රශ්න මාලාව මුද්‍රණය කිරීමටත් එය රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ඉටු කරවා ගැනීමටත් තීරණය විය.

කෘ.සං.1 සහ 2 උපලේඛනවල කඩිනම් සාරාංශ වාර්තාවන් දෙකක් ගනන්ගන්නා නිලධාරීන් ගේ ක්ෂේත්‍ර වැඩකටයුතු අවසන් වූ විගසින් ලබා ගැනීම සඳහා කෙටුම් පත් ඉදිරි පත් කෙරින.

කෘ.සං.1 හි තොරතුරු ග්‍රා නි කොට්ඨාශ මට්ටමින් සරංශ ගත කිරීම කෘ.සං.3 නම් වූ ලේඛනයේ ඇතුළත් කිරීමටත් මෙම ලේඛනය කෘ.සං.1 උපලේඛන පොත සමඟ අවසානයට අමුණා ප්‍රයෝජනයට ගැනිමටත් තීරනය විය. තවද එම උපලේඛනය අකුරු වෙනත් පාටකින් මුද්‍රණය කිරීමත් තීරනය විය. මෙම උපලේඛන පොතේ කවරය සඳහා ඝනකම් කඩදාසියක් යොදා ගැනිමටත් තිරණය විය.

කෘ.සං.2හි තොරතුරු ග්‍රා නි කොට්ඨාශ මට්ටමින් කඩිනමින් ලබා දීමේ අදහස ඇතුව සකස් කරන ලද කෘ.සං. 4 නම් වූ සාරාංශ ලේඛනය ද සාකච්ඡාව සඳහා ඉදිරිපත් කෙරිණ.

ඒ ඒ ග්‍ර නි කොට්ටාශය වෙනුවෙන් සම්පූර්ණ කරනලද සියළුම කෘ.සං.2 උපලේඛන වල අඩංගු තොරුවලින් මූලික තොරුතුරු සියල්ලම විස්තරාත්මකව කඩිනමින් ගණන්ගන්නා නිලධාරින් ලවා සිය ක්ෂේත්‍ර කටයුතු අවසන් වූ වහාම සම්පූර්ණ කරවා ගැණිමේ අදහසින් සකස් කරන ලද්දකි. මෙම ආකෘතිය පොතක් ලෙස මුද්‍රණය කිරීමටත් එහිදී ගොවිකාණ්ඩ මට්ටමෙන් රැස් කරන තොරතුරු ඇතුළත් සෑම කෘ.සං.2 උපලේඛනයකින්ම උපුටා ගන්නා තොරුතුරු තීරුවල ඇතුළත් කිරීම සහ එම පිටුවේ අවසන් තීරුවේ එකතුව සටහන් කිරීමටත් හැකිවෙන අයුරින් සකස් කොට ඇත. මෙලෙස එක් ග්‍රා නි කොටසක් වෙනුවෙන් පිටු කිහිපයක් වැයවෙන අතර මුළු ග්‍රා නි කොට්ටාශය වෙනුවෙන් වූ සාරංශය අවසානයට ඇතුලත් කිරීමටත් එසේ ඇතුළත් කිරීමේ දි කාරක තත්වය වෙන්වෙන්ව දැක්වීමට සහ බිම් ප්‍රමාණය අක්කර රූඩ් පර්චස් වලට හරවා ඇතුළත් කිරීමටත් තීරනය විය. කෙසේ වුවද

මෙම සරාංශ වාර්තාව සැකසීම නිවැරදි සහ පහසුවෙන් ඉටුකිරීම යන කරුණු සලකා බලා සංශෝධනයන් කිහිපයක් සිදු කිරීමට යෝජනා විය. ඒ අතුරින් සාරාංශ ලේඛනයේ පිටු සහ අවසන් සාරාංශ පිටුව එකම අතට සකස් කිරීම සහ ඒ ඒ පිටුවෙන් පිටුවට සඳහන් කොට ඇති සාරාංශයන් හි තීරු වලට ඉදිරියෙන් යොදා ඇති අංකනයන්ම අවසන් පිටුවේ තීරු වලත් යොදා ගැනිමටත් හැකිවන අයුරින් සරාංශ ලේඛනයේ මුල් පිටු, සහ අවසන් පිටු සැකසීම යෝග්‍ය බව තීරණය විය.

සංගණනය පිළිබඳ වූ ගැසට්නිවේදනය සැකසීම සහ ඒ ඒ වගන්ති අනුව කෙරෙන පත් කිරීම් පිළිබඳව සොයා බලා කටයුතු කිරීම එස් සංගරපිල්ලේ මහතාට පැවැරිණ.

සංගණනයේ ගණන්ගැනීම් කටයුතු සඳහා ජන සංගණනයේ සංගණන කාණ්ඩ පදනම් කොට ගෙන ගණන්ගන්නා නිලධාරීන්ට වැඩ කටයුතු පැවරීමට තීරණය විය. මේ අනුව සාමාන්‍යයෙන් දිවයිනේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ ගණනට වඩා සියයට 20 ක් පමන වැඩි ගණන්ගන්නා නිලධාරින් සංඛ්‍යාවකගේ සේවය ලබා ගැනිමට සිදුවිය හැකි බව පැවසින.

දිස්ත්‍රික්ක මට්ටමෙන් සාරාංශ දත්ත ඇතුළත් කොට මෘදුකාංග තැටි ලබා ගැනීමට හැකි වැඩපිළිවෙලක් සකැසීමටත් එ සඳහා අවශ්‍යවන සංඛ්‍යාන වගුවල විස්තර මිගාර මහතා වෙත ලබා දීමටද මෙහිදී සාකච්ඡා විය.
අතිකාල පදනම යටතේ කඩිනම් වැඩ කටයුතු ඉටුකරගැනීමට හැකි ඉඩකඩ ද මෙහි දී සාකච්ඡා විය. මේ අනුව තාවකාලිකව අතිරේක නිලධාරින් සංඛ්‍යාවකට ඉඩ සැළසීමට හැකි බව සඳහන් විය.

පස්වරු 4. 45 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය .

ජේ. දොඩම්ගොඩ
සංඛ්‍යාලේඛනඥ

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2002-03-01 වන දින පස්වරු 2.30 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණි ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
5. ජේ දොඩම්ගොඩ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
6. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජේ. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී සංගණන නිලධාරීන්ගේ දිවුරුම් ප්‍රකාශය , ගණන්ගන්නා නිලධාරීන්ගේ අක්ත පත්‍රය සහ පුහුණුවීමේ පංති සඳහා කැඳවීමේ ලිපිය අවශ්‍ය පිටපත් ප්‍රමාණයන් දෙපාර්තමේන්තු වේ මුද්‍රණ අංශයෙන් මුද්‍රණය කිරීමට තීරණය විය.

03. කෘ සං 2 උපලේඛන මගින් රැස්කෙරෙන තොරතුරු ගණන්ගැණීම අවසන් වූ විගසින් ගණන්ගන්නා නිලධාරීන් ලවා සකස් කරවා ගැනීමට නියමිත සාරාංශ වාර්තාව සඳහා යොදාගැනීමට කලින් වතාවේ ඉදිරිපත් කළ කෘ සං 4 නම් වූ ආකෘතියේ සංශෝධිත ආකෘතිය සළකා බැලිණ. කෘ සං 4 න් සාරංශ ගත කෙරෙන ප්‍රශ්න වල කෘ සං 2 හි යොමු අංක ආකෘතියේ තීරු වල සඳහන් ක්‍රිම යෝග්‍ය යැයි යෝජනා වුවද මෙම ආකෘතිය පිරවීම සම්බන්ධව දෙවන පුහුණු පංතියකින් උපදෙස් දීමට තීරණය කොට ඇති බව සහ උපදෙස් පොතේ ද සවිස්තරව දක්වා ඇති බැවින් එසේ අංක ඇතුලත් නොකිරීමට ද තීරණය විය. එහි දී කලින් රැස්වීමේ දී යොජනා කල වැදගත් වෙනස්කම් සියල්ල අනුව සැකැසුණු මෙම සංශෝධිත ආකෘතිය වඩා සුදුසු යැයි තීරණය විය.

04. සංගණනයේ දෙමළ භාශාවෙන් ලිපිලේඛන කටයුතු සහ උතුරු නැගෙනහිර පළාත්වල කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ වී තනබාලසිංහම් මහතාගේ සේවය ලබා ගැනීම අවශ්‍ය බැවින් දැනට සතියකට දින දෙකක් ඒ මහතාගේ සේවය ලබා දීමට තීරණය විය.

05. දැනටමත් මුද්‍රණ කටයුතු සඳහා ලබා දි ඇති ආකෘතීන් සියල්ල ~~රාජ්‍ය භාෂා~~ දෙපාර්තමේන්තුව වෙත යවා දෙමළ පරිවර්තනයන් කර ගැණිමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ගලහිටියාව මහතාට දැන්වීමට තීරණය විය.

06. සංගණනයේ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් පිටපත් ලක්‍ෂයක් මුද්‍රණය කිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා සුදුසු චිත්‍රයක් යොදාගැනීමට අවශය බව දන්වන ලදි. පාසැල් ළමුන් දැනුවත් කොට ඒ තුලින් ගොවි ජනතාව වෙත සංගණන පනිවුඩය ගෙනයාමට අදහස් කොට ඇති බව දන්වන ලදි. සංගණන පනිවුඩය වඩා පුළුල් ලෙස සියලුමදෙනාට ලබා දීමේ අරමුණෙන් එය දෙපාර්තමේන්තු වෙබ් පිටුවේ දැක්වීමට පියවර ගතයුතු බව තීරණය විය.

07. සංගණනයේ ක්‍ෂේත්‍ර කටයුතු සඳහා අවශය වන පෑන් ලිපි ලේඛන පයිල් කවර ආදිය දිස්ත්‍රික් මට්ටමින් මිලදී ගැනිමට හැකිවන අයුරින් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛනඥ වෙත මුදල් ප්‍රතිපාදනයන් ලබාදීම වඩා පහසු සහ යෝග්‍ය එකක් වනු ඇතැයි හැඟෙන බැවින් ඒ සඳහා අවශ්‍ය මූලික ඇස්තමේන්තු දැනමටත් පිළියෙල කරමින් පවතින බව කමිටුවට දන්වන ලදුව එයට එකඟත්වය පල කෙරිණ.

08. සංගණනයේ පුහුණු පංති සඳහා සහභාගිවන අයට කෑම බීම සැපයීම ගෙවීම අධීක්‍ෂන නිලධාරීන් ගණන්ගන්නා නිලධාරින් ආදී කරුණු රැසක් ඉදිරි රැස්වීම් වලදී සාකච්ඡා කොට අවසන් තීරණයන්ට එළඹීමට නියමිතය.

09. මීලඟ රැස්වීම 2002 මාර්තු 07 වන දින පස්වරු 2.30 ට කැඳවීමේ එදින සාකච්ඡාව සඳහා වනු උපලේඛනයේ කෙටුම්පතක් ද බෙදා දෙන ලදි.

පස්වරු 4. 45 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ජේ. දොඩම්ගොඩ
ජේ. සංඛ්‍යාලේඛනඥ

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනයඃ- 2002-03-08 වන දින පස්වරු 2.30 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1\. ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්

| | | |
|---|---|---|
| 2. බී ඩී පී එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 3. ආචාර්ය ගාමිණී ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 4. එස් මදුරප්පෙරුම | මහතා | අධ්‍යක්ෂ |
| 5. එස් සංගරපිල්ලේ | මහතා | ආරාධිත |
| 5. ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 7. ජේ දොඩම්ගොඩ | මහතා | ජේ. සංඛ්‍යාලේඛනඥ |
| 8. ඩී ඩී එම් වී පෙරේරා | මෙය | ජේ. සංඛ්‍යාලේඛනඥ |
| 9. සී ඩී ද සිල්වා | මහත්මිය | ජේ. සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ජාව ආරම්භ විය.

02\. මෙදින පැවැති රැස්වීමේදී වතු උපලේඛනය සාකච්ජා කිරීමට ප්‍රදාන තේමාව වූ අතර රට ප්‍රථමයෙන් කිහිපයක්ම සාකච්ජාවට භාජනය කොට පහත තීරණයන්ට එළඹිණ.

සංගණනය පිළිබඳව විදුහල්පතිවරු මගින් පාසල් ළමුන් දැනුවත්කොට මවුන්ගේ දෙමව්පියන්ගේ සහයෝගය ගණන්ගන්නා නිලධාරියා වෙත ලබා දීම සඳහා සකස් කරන ලද ලිපියක සහ එම ලිපියේ සඳහන් පනිවුඩය පාසැලේ සතියේ ආරම්භක රැස්වීමේ දී ගුරු ශිෂ්‍ය දෙපිරිසටම ප්‍රකාශකරන ලෙස දන්වා අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් ගෙන් විදුහල්පතිවරුන් වෙත යැවෙන ලිපියක ද කෙටුම් පත් ඉදිරිපත් කරන ලදුව අනුමත කෙරිණ.මෙම ලිපියේ රාජ්‍ය ලාංජනය සහ සංගණන අධිකාරිගේ නම ද යෙදීමට තීරණය විය.

ප්‍රචාරක කටයුතු සඳහා මුද්‍රණය කරන දැන්වීම සඳහා චිත්‍ර දෙකක් ඉදිරිපත් කරන ලද අතර එය සෞන්දර්‍යායතනයේ ප්‍රවීනයන් ගෙන් විමසා මවුන්ගේ නිර්දේශ ලබා ගැනීමට තීරණය විය.

දැනට මුද්‍රණය සඳහා මුද්‍රණ සංස්ථාව වෙත දී ඇති ආකෘතීන් සඳහා එම සංස්ථාවට අත්තිකාරම් මුදලක් ලෙස ඉල්ලා ඇති මුදල ගෙවීමට සංගණන අධිකාරි අනුමැතිය ලැබිණ.

දැනට මුද්‍රණය කිරීම සඳහා දී ඇති ආකෘති සියල්ලම දෙමල භාෂාවට පරිවර්තනය සඳහා දැනටමත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ පරිවර්තක වෙත යවා ඇති අතර එම ආකෘති ද අවශ්‍ය ප්‍රමාණයන් මුද්‍රණය කිරීමට තීරණය විය.

කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන නිලධාරීන්ගේ වගකීම් සහ කාර්‍යභාරය පිළිබඳව වූ උපදෙස් සංග්‍රහයක් ද ඉදිරිපත් කරන ලදුව සාකච්ජා කොට එය මුද්‍රණය සඳහා යෝග්‍ය බවට තීරණය විය.

අනතුරුව සාකච්ජා කළේ වතු උපලේඛනයයි. දැනටමත් සංශෝධිත වතු නාමලේඛනයන් දිස්ත්‍රික් දෙකකින් ලැබී ඇති බව ප්‍රකාශ විය.

පහත සංශෝධනයන් කිරීමට එකඟ විය.

කාරකයාගේ වෘත්තීය සුදුසුකම් ලබා තිබේද යන ප්‍රශ්නයට පිළිතුර ඔව් නම් පුහුණුව ලැබූ කාල සීමාව පිළිබඳව විමසීම සඳහා වූ අතුරු ප්‍රශ්නයක් ඇතුළත් කිරීමට තීරණය විය.

2.6 හි ඇති රෝම අංකනයන් ඉවත් කිරීම

3 හි බිම් ප්‍රමාණය සටහන් කරන ඒකකය පිළිබඳව විමසා එයට පිළිතුර ලියා දැක්වීම සඳහා හිස් කොටුවක් යෙදීම 4 වන කොටසේ සහ එළඹෙන සෑම ප්‍රශ්නයකම බිම් ප්‍රමානය දක්වන අවස්ථාවල දී පිළිතුරු සපයන ඒකකය අකුරින් ලිවීම සඳහා හිස් කොටුවක් ඇතුළත් කිරීමටද තීරණය විය.
තවද 4 වන කොටසේ 8 සිට 14 දක්වා තීරුවල බිම් ප්‍රමාණය පිළිබඳව විමසන බැවින් එම තීරු සියල්ලටම පොදු වනසේ බිම් ප්‍රමාණය යනුවෙන් යෙදීම යෝග්‍ය බව තීරණය විය.

5.1 තේ 5.2 රබර් 5.3 පොල් යන ප්‍රශ්න සියල්ලටම ඉහත දැක්වූ පරිදි උඩින් ම පිළිතුර සපයන ඒකකය ලිවීමට සහ අක්කර / හෙක්ටයාර ලෙස දක්වා ඇති තීරු බිම් ප්‍රමානය ලෙස නම් කිරීමටත් තීරණය විය. එම ප්‍රශ්න සියල්ලේම ඉංග්‍රිසි පරිවර්තනයන්ද නිවැරදි කිරීමට තීරණය විය. මෙසේ පරිවර්තනයන් සංශෝධනය කිරීමේ දී සැකමුසු සෑම අවස්ථාවක දීම අදාල ආයතන සහ නිලධාරීන්ගෙන් විමසීමට තීරණය විය.

5.4 හි වෙනත් ස්ථිර භෝග යටතේ අක්කර හෝ හෙක්ටයාර ගණන සැපයීමට ඉඩ කඩ සැලසීම සහ කුඩා ප්‍රමාණයන් දැක්වීමට ගස් වැල් හෝ පඳුරු ගණන දැක්වීමට ඉඩකඩ සැලසීමට තීරණය විය.

5.5 හි කාලීන භෝග යටතේ 6 සිට 11 දක්වා තීරු වලට උඩින් ඇති හිස් කොටු වල භෝගයේ නම සඳහන් කොට රට යටින් පාට කොට ඇති තීරුවේ බිම් ප්‍රමාණය යනුවෙන් යෙදීමටත් තීරණය විය.

6 වන කොටසේ 9 වන තීරුවේ 'ලොරි' 3 වන තීරුවේ සටහන් කොට ඉතිරි තීරු අංකනයනක් ඒ අනුව සංශෝධනය කිරීමටත් මෙහි සපයා ඇති හිස් තීරු වෙනුවට වෙනත් වැදගත් යන්ත්‍රෝපකරණ දැක්වීමට හැකියාව වැඩිදුර විමසීමටත් තීරණය විය. පරිවර්තන වැකි ද යලි සලකා බැලීමට දන්විය.

7 වන කොටස පොහොර භාවිතය 7 සිට 10 දක්වා තීරුවලට උඩින් ඇති හිස් කොටු වල භෝගයේ නම යන්න මුද්‍රණය කිරීමට තීරණය විය. පොහොර වල වෙළඳ නාමය හෝ ඒ ඒ භෝගය අනුව තොරතුරු ලබා ගැනීමේ දී ඇති වන සීමිතතාවයන් ගැනද දීර්ඝව කරුණු දැක්විණ.

9 වන කොටසේ 9.1 හි නේවාසික ජන සංඛ්‍යාව යනුවෙන් යෙදීම සහ 9.2 හි ශ්‍රේණිය වෙනුවට (Occupational Category) රැකියාවේ ස්වභාවය විමසීමත් අවුරුදු 15 ට වැඩි යන්න අවුරුදු 15 හා රට වැඩි යනුවෙනුත් වෙනස් කිරීමට තීරණය විය.

සංගණනයේ මූලික සාරාංශ වාර්තා ලබා ගැණිමට අදාලව පද්දති විශ්ලේශක මිගාර ප්‍රනාන්දු මයා මී ලඟ රැස්වීමට කැඳවීමටත් එම රැස්වීම මාර්තු 18 වන සඳුදා දිනයට යොදාගැනීමටත් තීරණය විය.

පස්වරු 4. 45 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය .

ජේ. දොඩම්ගොඩ
සංඛ්‍යාලේඛනඥ

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබද කමිටු සාකච්ජාව

දිනයඃ- 2002-04-04 වන දින පස් වරු 2.30 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

| | | | |
|---|---|---|---|
| 1. | ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා | සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල් | |
| 2. | ආචාර්ය ගාමිණි ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 3. | එස් මුදුරප්පෙරුම | මහතා | අධ්‍යක්ෂ |
| 4. | එස් සංගරපිල්ලේ | මහතා | ආරාධිත |
| 5. | ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 6. | සී එන් ගලහිටියාව | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 7. | ජේ දොඩම්ගොඩ | මහතා | ජේ. සංඛ්‍යාලේඛනඥ |
| 8. | ඩී ඩී එම් වී පෙරේරා | මෙය | ජේ. සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ජාව ආරම්භ විය.

02. මේදින පැවැති රැස්වීමේදී කරුණු කිහිපයක්ම සාකච්ජාවට භාජනය කොට පහත තීරණයන්ට එළඹිණ.

03. වතු උපලේඛනය තැපැල් කිරීම සහ ආපසු ගෙන්වා ගැණීමේ කටයුතු තැපැල් මාර්ගයෙන් ඉටු කෙරෙන බැවින් ඒ සඳහා ලිපිකවර අඟල් 7" X 10" ප්‍රමාණයේ 30,000ක් මුද්‍රණ සංස්ථාවෙන් මුද්‍රණය කර ගැණීමට අනුමැතිය ලැබින.

04 ලිපි කවරවල මුද්දර ගැසීමේ යන්ත්‍රයක් (Stamping Machine) යොදා ගෙන මුද්දර ගැසීම සඳහා යන්ත්‍රයක් 3 වන අංශයට ලබා ගැණිම දුෂ්කර නම් ප්‍රධාන කාර්යාලයේ මුද්දර ගැසීමේ යන්ත්‍රයෙන් එදිනෙදා යැවෙන ලිපි වලට මුද්දර ගසා තැපැල් කිරීමට සිදුවන බව දන්වන ලදි. කෙසේ වුවද ආපසු එවීම සඳහා වතු උපලේඛන යැවෙන කවරවල බහා මුද්දර අලවන ලද ලිපිකවරයක් යැවීම ට අවශ්‍ය වන මුද්දර (දළ වශයෙන් 10,000) 3 වන අංශය මගින් මිලයට ගැනීමට දන්වන ලදි.

05 අනතුරුව සාකච්ජා කළේ ගණන්ගන්නා නිලධාරීන් පුහුණු කිරීම සඳහා සකස් කරක ලද උපදෙස් සංග්‍රහයේ (Training Guide) අන්තර් ගතව ඇති කරුණු වූ අතර එය ඉදිරි රැස්වීම් වලදී වැඩිදුර අධ්‍යනය කිරීමට නියමිතයි.

06 සංගණන ප්‍රශ්නාවලියේ රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නම ඇතුළත් කිරීම අවශ්‍ය බව දන්වන ලදි.

07 ගණන්ගන්නා නිලධාරීන්ට උපලේඛන බාරදීම සහ ආපසු බාරගැනීම සඳහා සකස් කළ ආකෘතියක කෙටුම්පත සලකා බැලූ කමිටුව එය ද්‍රවිඩ භාෂා පරිවර්තනය ද ඇතුලත් කොට පිටපත් 3,000ක් මුද්‍රණය කරවා ගැනීමට තීරණය විය. F1 ලැයිස්තු ක්ෂේත්‍ර කටයුතු සඳහා මුදා හැරීමේ දී දිස්ත්‍රික් ජේ. සං. ලේ. සහ සං. ලේ. වරුන් පෞද්ගලිකවම වගකීමට බැදී සිටින බව අවධාරණය කළයුතු බව සඳහන් විය. තවද ආකෘති ආපසු එවීමේ දී අත්සන් කොට අඩුපාඩු නොමැති බව සහතික කිරීම එසේ අඩුපාඩු සහිත නම් ගෙවීම් නොකිරීමට වගබලා ගැනීම වැනි කරුණු පිළිබඳව ද දිස්ත්‍රික් ජේ. සං. ලේ. සහ සං. ලේ. වරුන් දැණුවත් කිරීම අත්‍යාවශ්‍ය බවද සඳහන් විය.

08 සංගණන අධිකාරි පත්කිරීම පිළිබද ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කිරීමට කටයුතු කිරීම සහ දිස්ත්‍රික් සංගණන කොමසාරිස්වරු සහ නියෝජ්‍ය කොමසාරිස්වරු පත්කිරීම ආදි කටයුතු සම්බන්ධ ගැසට් නිවේදනයන් ප්‍රකාශයට පත්කිරීමේ කටයුතු සඳහා එස් සංගරපිල්ලේ මහතා අවශ්‍ය පියවර ගනු ඇත.

09 අනතුරුව සාකච්ඡා කෙරුණේ කෘෂිකම් සංගණනයේ කටයුතු සඳහා ජන සංගණනයේ සංගණන ඒකක පූර්ව ලැයිස්තු ගත කිරීමේ ආකෘති (F1 forms) 14 වන අංශයෙන් ලබා ගැණිම පිළිබඳවය.
ඒම ලේඛන මුද්‍රා හැරීම සඳහා 14 වන අංශයේ අධ්‍යක්ෂක එච් ආර් ගුණසේකර මහතාගේ පූර්ණ සහයෝගය ලබා ගැණීමට තීරණය විය.

10 මෙම ජන සංගණන (F1 forms) ආකෘතින් ලැබී ඇති සියල්ල ලේඛන ගතකොට (Preparing an Inventry) ඉරී කැඩී ගොස් ඇති ආකෘතින් අලවා ප්‍රකෘති කොට බැදීම ( Binding) ආකෘතින් අස්ථාන ගත වි ඇති සියල්ල සහ නොලැබී ඇති සියල්ල නිශ්චිතව දැනගැනිමටත් දැනට ලැබී ඇති ජන සංගණන (F1 forms) පූර්ව ලැයිස්තු ගත කරන ලද ආකෘතීන් ඒ ඒ ප්‍රදේශීය කොට්ඨාශ මට්ටමෙන් මිටි බැදීමට ද ඉතා කඨිනම් වැඩ පිළිවෙලක් සැකැසීම අවශ්‍ය බැවින් එම කාර්යය සංවිධානය කිරීම හා සම්බන්ධකරණය කිරීම නියෝජ්‍ය අධ්‍යක්ෂ සී එන් ගලහිටියාව මහතාගේ සේවාව ලබා ගැනිමට තීරණය විය.

11 මෙම කටයුත්ත ඉටු කරදීම සඳහා සංගණන අංශයට අනුයුක්ත කොට ඇති සංඛ්‍යාලේඛනඥ එම් ඩී එම් ප්‍රනාන්දු මහතාගේ මූලිකත්වයෙන් මුද්‍රණ අංශයේ සංඛ්‍යාලේඛන රාජපක්ෂ මහතා සහ සංගණන අංශයට මෑතක දී අනුයුක්ත කරන ලද පොත් බඳුම් කරු සහ කෘෂිකම් අංශයේ සංඛ්‍යාලේඛන නිලධාරින් වන පී නන්දසේන / පී ආර් මුනසිංහ යන මහතුන්ගෙන් සමන්විත කණ්ඩායමක් යෙදවීමට ද තීරණය විය. ඒ අනුව මෙම කාර්යය සඳහා වහාම එම කණ්ඩායමට ක්‍රියාත්මකවීමට දැණුම්දීමට නියමිතය.

12 ජන සංගණන (F1 forms) පූර්ව ලැයිස්තු ගත කරන ලද ආකෘතීන් අස්ථාන ගත වී හෝ නොමැති ග්‍රාම නිලධාරි වසම් වල එම ලැයිස්තු නැවත ලේඛනගත කිරීමේ වැඩපිළිවෙලක් ද කෘෂිකම් සංගණනයට සමගාමීව සිදු කිරීමට ද තීරණය විය.

13 සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු පිළිබඳව අදහස් විමසීමට දිස්ත්‍රික් ජ්‍යේ. සං. ලේ. සහ සං. ලේ. වරුන් අප්‍රියෙල් මස අවසන් සතියේ දී පමන ප්‍රධාන කාර්යාලයට කැඳවීමට තීරණය විය.

14 කෘෂිකම් අංශයේ ගරාජය පවතින කොටසේ උඩුමහලේ සංගණන පුහුණු පංති පැවැත්වීමට හැකිවනසේ වායු සමීකරන යන්ත්‍රයක් සහ පුටු 25ක් ලබා දීමට හැකි ඉඩකඩ සලකා බැලීමට තීරණය විය.

15 මීළඟ රැස්වීම 10 - 04 - 2002 දින පෙර වරු 9.45ට පැවත්වෙන අතර එදිනට ගණන්ගන්නා නිලධාරීන් පුහුණු කිරීම සඳහා සකස් කරක ලද උපදෙස් සංග්‍රහයේ (Training Guide) අන්තර් ගතව ඇති කරුණු පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සහ දත්ත සැකසුම් කටයුතු පිළිබඳව පද්ධති විශ්ලේශක/වැඩ සටහන් සම්පාදක මිගාර ප්‍රනාන්දු මහතා සමග සාකච්ඡා කිරීමට නියමිතය.

16 රැස්වීමේ කටයුතු සවස 4.30 ට පමණ අවසන් විය.

ජ්‍යේෂ්ඨ සංඛ්‍යාලේඛනඥ
(ජේ දොඩම්ගොඩ)

................................

ඉහත ජේදයන් අනුව තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස ඔබේ අවධානය යොමුකරන්න.

අධ්‍යක්ෂ ජනරාල්

# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2002-04-08 වන දින පෙර වරු 11.00 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1\. ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරී සහ ජන සං අ. ජනරාල්

3\. එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ

2\. ආචාර්ය ගාමිණී ද සිල්වා මහතා අධ්‍යක්ෂ

3\. එස් මුදුරප්පෙරුම මහතා අධ්‍යක්ෂ

4\. එස් සංගරපිල්ලේ මහතා ආරාධිත

5\. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ

6\. මිගාර ප්‍රනාන්දු මහතා වැඩසටහන් සම්පාදක පද්ධති විශ්ලේශක

7\. ජේ දොඩම්ගොඩ මහතා ජ්. සංඛ්‍යාලෙඛනඥ

8\. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජ්. සංඛ්‍යාලෙඛනඥ

9\. සී ඩී ද සිල්වා මහත්මිය ජ්. සංඛ්‍යාලෙඛ නඥ

සංගණන අධිකාරී හා සංඛ්‍යාලෙඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02\. මෙදින පැවැති රැස්වීමේදී කරුණු කිහිපයක්ම සාකච්ඡාවට භාජනය කොට පහත තීරණයන්ට එළඹිණ.

කෘෂිකර්ම සංගණනයේ දත්ත සැකසුම් කටයුතු පිළිබඳව ප්‍රථමයෙන් සාකච්ඡාවට භාජනය වි ය. දත්ත සැකසුම් අංශය සමග සැළසුම් කෙරෙන වැඩසටහනක් ලබා දී කෘ සං 1 උපලෙඛනයෙන් ලබා ගන්නා මූලික වැදගත් තොරතුරු සියල්ලම සාරාංශ වාර්තාවේ (කෘ සං 3) ග්‍රාම නිලධාරී කොට්ඨාස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ දිස්ත්‍රික් මට්ටමෙන් සංඛ්‍යාලෙඛන වගු ලබා දීමට හැකි වනසේ දිස්ත්‍රික් සංඛ්‍යාලෙඛන අංශයේ පරිගනකයෙන්ම කඩිනමින් විශ්ලේශනය කර ගැනීමට අදාල වගුවල ආදර්ශ කිහිපයක් සාකච්ඡාවට භාජනය කෙරිණ. මෙම වගු සමග ජන සංගණනයේ ලබාගත් ජනගහන තොරතුරුද එකාබද්ධ කොට ලබාගැනීමට ද සැළසුම් කොට ඇත. ඒ සඳහා ජන සංගණන අංශයේ කේතාංකම යොදා ගැනීම අවශ්‍ය බව පෙන්වා දෙන ලද අතර 14 වන අංශයෙන් සකස් කරන ලද කේතාංක දැක්වෙන මුද්‍රිත ලැයිස්තු ප්‍රයෝජනයට ගන්නා ලෙස් දන්වන ලදි.
දත්ත සැකසුම් අංශයේ වැඩසටහන් සම්පාදක පද්ධති විශ්ලේශක මිගාර ප්‍රනාන්දු මහතාද සහභාගි වූන අතර එම කටයුතු සම්බන්ධකරනය කිරීමට කෘෂිකර්ම අංශයේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලෙඛනඥ ජේ . දොඩම්ගොඩ මහතාට පැවරිණ. මේ සඳහා එම අංශවල නිලධාරීන් පුහුණු කොට දැණුවත් කිරීම වැදගත් බවද පෙන්වා දෙන ලදි. භෝග වර්ග 60කත් ග්‍ර නි කොට්ඨාස ඇතැම් විට 150 ක් දක්වාත් දීර්ඝ වගු ලබා ගැනීමට හැකිවන අයුරින් දත්ත වැඩ සටහන් සැකැසිය යුතු බවද පැවසින.

කෘ සං 2 හි තොරතුරු වල සාරාංශ ඇතුලත්ව කඩිනමින් ලබා ගැනෙන කෘ සං 4 නම් සරාංශ වාර්තාව මගින් ලබා ගැණිමට අපේක්ෂිත තොරතුරුද ඇතුලත් සංඛ්‍යාන වගුවල ආදර්ශ වගු ඉදිරි රැස්වීම්වලට ඉදිරිපත් කිරීමට නියමිතය.

අනතුරුව සාකච්ජා කෙරුණේ සංඛ්‍යාලෙඛන නිලධාරීන්ගේ වගකීම් හා කාර්යභාරය පිළිබඳව සැකසූ කලින් දින සාකච්ජා කල කෙටුම්පත පිළිබඳවයි. මෙම කෙටුම්පතට නිලධාරීන් පුහුණු කිරීම ,ලෙඛන බෙදා හැරීම හා ආපසු භාර ගැණීම, අධීක්ෂණ කටයුතු , සම්බන්ධීකරණය ආදිය පිළිබඳ සවිස්තර උපදෙස් අඩංගු කොට තිබිණ.

F1 ලේඛනය ගැන වඩාත් සැළකිළිමත් විය යුතු බව අධ්‍යක්ෂ ජනරාල් ගේ අදහස වූ අතර ඒ සඳහා ආකෘති බාර දිමේ දී සහ ආපසු ලබා ගැණිමේ දී F1 ලේඛනයන් අදාල සංගණන කාණ්ඩ අංකය ද

සඳහන් කොට බාර දීමට හැකිවන අයුරින් මුද්‍රිත ආකෘතියක් සකස් කොට ඇති බව ප්‍රකාශ විය. කෙසේ වුවද F1 ලේඛනයන් පිළිබඳ පූර්ණ වගකීම දිස්ත්‍රික් ජ්‍යෙ සං ලේ හා සං ලේ වරු වෙත පැවරෙන බව සඳහන් කරන ලෙස දන්වන ලදි.

ප්‍රචාරය ලබා දීම

සංගණනය පිළිබඳව ගොවි ජනතාව අතර පුළුල් ප්‍රචාරයක් දීමත් එමගින් දත්ත ලබා ගැනීමේ කටයුතු සඳහා ඔවුන්ගේ සහයෝගය දිනාගැනීම සහ ඒ තුළින් එම දත්ත වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ ත් අරමුණ ඇතිව පහත සඳහන් පියවරවල් ගැනීම සළකා බැලිණ.

පාසල් විදුහල්පති වෙත යැවෙන ලිපියක් මගින් ළමුන් හරහා සිය මව්පියන් වෙත ගෙන යන පණිවුඩයක් මුද්‍රණය සඳහා අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත.

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවෙන් නිසදවන පාසල් අභ්‍යාස පොත් වල පිටකවරයේ අනුග්‍රාහක පදනම යටතේ කෘෂිකර්ම සංගණනය - 2002 අගෝස්තු යන පාඨය මුද්‍රණය කරවා කෘෂි ක්ෂේත්‍රයට අදාල සිත්ගනිනා ජයාරූපයක් මුද්‍රණය කිරීම සිත්ගන්නා ජායා රූපයක් ඇතුළත් කිරීමටත් කැමත්ත පළ කොට ඇත.

කලින් වතාවේ මෙන් වෘත්තීය චිත්‍ර ශිල්පියකුගේ චිත්‍රයක් ඇතුළත් කොට 15 20 ප්‍රමාණයේ දැන්වීමක් රතු පසු බිමේ කළු සුදු වර්ණ යොදා සිංහල සහ දෙමළ භාෂා වලින් මුද්‍රණය කර ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති ගෙන් මිළ ගණන් කැඳවීමට තීරණය විය.

අනතුරුව සාකච්ඡා කෙරුණේ ගෙවීම් පිළිබඳවයි.

රැස්වීමේ කටයුතු දහවල් 12.30 ට පමණ අවසන් වූ අතර මීලඟ රැස්වීම 18-04-2002 දිනට පැවත්වීමට තීරණය විය.

ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ
(ජේ දොඩම්ගොඩ)